# මාසික
# විවරණිකාව

2010 පෙබරවාරි



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

### 60 වැනි වෙළුම 02 වැනි කලාපය

## 2010 පෙබරවාරි

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

| පටුන | | පිටුව |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් | ..... | 05 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2010 පෙබරවාරි | ..... | 06 |
| 1. 2010 ජනවාරි මස උද්ධමනය | ..... | 06 |
| 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 පෙබරවාරි | ..... | 07 |
| 3. 2010 දෙසැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරිත්වය | ..... | 07 - 09 |
| 4. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) | ..... | 09 |

# 1 වන කොටස
# මාසික සිදුවීම්
## 2010 පෙබරවාරි

### රාජ්‍ය මූල්‍ය අංශය

- කිරිපිටි ආනයනයේ දී අයකර ගනු ලබන මුළු බදු ප්‍රමාණය කිලෝග්‍රෑමයට රුපියල් 100 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා අඩු කරන ලදී.
- ආහාරයට ගන්නා ඇතැම් තෙල් වර්ග සහ ඒවායේ කොටස් ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 25 ක තීරු බදු අත්හැරීමක් ලබාදෙන ලදී.

### එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලැබුණු ප්‍රදාන

ශ්‍රී ලංකා රජය සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය අතර, ප්‍රදාන තුනකට අදාළ ගිවිසුම් සඳහා අත්සන් තබන ලදී.

(1) ගව වසංගතය තුරන් කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 පෙබරවාරි මස 3 වැනි දින එ.ජ.ඩොලර් මිලියන 0.184 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 21.09 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

(2) උතුරු පළාතේ නැවත පදිංචි වූවන් සඳහා බීජ සහ අනෙකුත් අත්‍යවශ්‍ය කෘෂිකාර්මික යෙදවුම් සැපයීම මූල්‍යනය කිරීම සඳහා 2010 පෙබරවාරි මස 8 වැනි දින එ.ජ.ඩොලර් මිලියන 0.876 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 100.48 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

(3) කිරි ගවයින් හා මීහරක් වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2010 පෙබරවාරි මස 08 වැනි දින එ.ජ.ඩොලර් මිලියන 0.335 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 38.42 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

### කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලෙන් ලැබුණු ප්‍රදාන

ශ්‍රී ලංකාවේ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන මූල්‍යනය කිරීම සඳහා 2010 පෙබරවාරි මස 23 වැනි දින ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර වි.ගැ.හි මිලියන 15.55 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.72 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**2 වන කොටස**

# පුවත්පත් නිවේදන

**2010 පෙබරවාරි**

## 1. 2010 ජනවාරි මස උද්ධමනය

*ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2002+100) මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතය, 2008නොවැම්බර් මාසයේ සිට පහළොස්වන මාසයටත් අනුක්‍රමික ව අඩු වෙමින් 2009 දෙසැම්බර් මාසයේ පැවැති සියයට 3.4 සිට 2010 ජනවාරි මස වන විට සියයට 3.1 දක්වා පහත වැටිණි. කෙසේ නමුත්, ලක්ෂ්‍යමය පදනම මත උද්ධමන අනුපාතය ප්‍රධාන වශයෙන් ම, 2009 අදාළ මාසයේ පැවැති පහළ පදනම පිළිඹිබු කරමින් අපෙක්ෂා කළ පරිදි සියයට 6.5 දක්වා ඉහළ නැගිණි. මූලික උද්ධමන මිනුමෙහි ද මෙයට ම සමාන නැඹුරුවක් දැකිය හැකි විය.*




මේ අතර, මාසික දර්ශකය මගින් පෙන්නුම් කරන පරිදි 2010 ජනවාරි මාසයේ දී පූර්ව මාසයට සාපේක්ෂව සාමාන්‍ය මිල මට්ටමෙහි සියයට 1.4 ක ඉහළ නැගීමක් වාර්තා විය. එනම්, දර්ශක අගය නිරපේක්ෂක වශයෙන් 213.5 සිට 216.4 දක්වා ඉහළ නැගිණි. දර්ශකයේ මෙම මාසික ඉහළ නැගීම සඳහා ආහාර සහ මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප කාණ්ඩයෙහි සියයට 1.5 ක ඉහළ නැගීම ප්‍රධාන වශයෙන්ම දායක විය. ඒ සඳහා මූලිකවම හේතු වූයේ සහල්, තේ, සමහර මත්ස්‍ය වර්ග සහ සීනි යන භාණ්ඩවල මිල ඉහළ යෑමයි. කෙසේ වුවද, දෙහි, ලොකු ළූණු,අමු මිරිස්, අර්තාපල් සහ තිරිඟුපිටිවල මිල පහළ යෑමක් වාර්තා විය. තව ද, අධ්‍යාපන (සියයට 7.4); ගෘහ උපකරණ හා දෛනික ගෘහ භාණ්ඩ කටයුතු (සියයට 1.9); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 1.5); සහ රෙදිපිළි හා පාවහන් (සියයට 1.0) යන උප කාණ්ඩයන්හි මිල ඉහළ යෑම් ද දර්ශකයේ ඉහළ නැගීම සඳහා දායක විය. කෙසේ වුවද, පෙට්‍රල් මිල අඩු කිරීම හේතුවෙන් ප්‍රවාහන උප කාණ්ඩයේ සියයට 0.9 ක පහළ යෑමක් වාර්තා විය.

## 2. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2010 පෙබරවාරි

*කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පාදක වර්ෂය = 2002) අනුව මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2010 ජනවාරි වන විට සියයට 3.1 දක්වා අඩු විය. කෙසේ වුවද, එහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය, 2009 අග වනවිට පැවති සියයට 4.8 සිට 2010 ජනවාරි මස තුළදී සියයට 6.5 දක්වා ඉහළ ගියේය. වාර්ෂික ලක්‍ෂ්‍යමය උද්ධමනයෙහි මෙම ක්‍රමානුකූල ඉහළයාම තුළින් පෙර වර්ෂයෙහි අඩු උද්ධමනයට හේතු වූ සාධකවල බලපෑම පහව යාමත්, අන්තර්ජාතික වෙළෙඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් යථා තත්ත්වයට පත්වීමත් පිළිබිඹු වේ.*

2009 වසර තුළදී දේශීය ආර්ථික කටයුතු දිරිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් තම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කරන ලදී. උද්ධමනයෙහි පහත බැසීම මෙන්ම උද්ධමනය සඳහා පැවති හිතකර පෙර දැක්ම මෙයට උපකාරී විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ පොලී අනුපාතික අඩු වෙමින් පවතී. දේශීය මෙන්ම ගෝලීය ආර්ථිකයේ පසු බැස්ම හේතුවෙන් පහත බසිමින් පැවති පෞද්ගලික අංශය වෙත ලබාදෙන ලද ණය ප්‍රමාණය, 2009 වසර අග වනවිට නාමික වශයෙන් ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

ආර්ථිකයෙහි මෙම වර්ධනයන් සැළකිල්ලට ගනිමින් ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම තවදුරටත් දිරිමත් කිරීම සඳහා 2010 පෙබරවාරි 15 දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලය විසින් වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය එලෙසම පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. මෙම මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය විවරණය කිරීමේ අරමුණින් මුදල් මණ්ඩලය විසින් ආර්ථික ප්‍රවණතාවයන් හා ආර්ථික කටයුතු වැඩි දියුණු වීමට ඇති ඉඩ ප්‍රස්ථා අඛණ්ඩව අධීක්ෂණය කරනු ඇත.

මීලඟට නියමිත මුදල් ප්‍රතිපත්ති විවරණය 2010 මාර්තු 16 වැනි දින ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

## 3. 2009 දෙසැම්බර් මාසයේ විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය

*පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට අපනයන සහ ආනයන යන දෙඅංශයෙහිම වර්ධනයක් වාර්තා විය. අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 723 දක්වා සියයට 6.4 කින් වර්ධනය වූ අතර, මේ සඳහා මූලික වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර භාණ්ඩ වෙළෙඳපොළේ තේ සහ රබර් ලබාගත් ඉහළ මිල ගණන් හේතුවෙන් කෘෂිකාර්මික අපනයන සියයට 40.2 කින් වර්ධනය වීමයි. 2009 දෙසැම්බර් මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,054 දක්වා සියයට 0.5 කින් ආන්තිකව වර්ධනය විය. අන්තර් භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයන මෙම වර්ධනය සඳහා මූලික විය.*

කෙසේ වුවත්, පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමග සසඳන විට 2009 වසරේ සමුච්චිත අපනයන ආදායම සහ ආනයන වියදම පිළිවෙලින් සියයට 12.7 සහ 29.4 බැගින් පහත වැටුණි. 2009 දෙසැම්බර් මාසයේ දී වෙළෙඳ ශේෂය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 330 ක් දක්වා සියයට 10.4 කින් දොළොස්වන වතාවටත් අඩු විය. ඒ අනුව, 2008 වසරේදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,897.4 ක්ව පැවැති සමුච්චිත වෙළෙඳ ශේෂය 2009 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එ.ජ.ඩොලර් දශ ලක්ෂ 2,798.6 ක් දක්වා සියයට 52.5 කින් පහත වැටුණි.







මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

2009 ජුනි මාසයේ සිට සැළකිය යුතු අන්දමින් ඉහළ ගිය ලංකා තේ මිල 2009 දෙසැම්බර් මාසයේ දී සියයට 32 ක වර්ධනයක් පිළිඹිබු කරමින් තේ කිලෝ ග්‍රෑමයක් එ.ජ.ඩොලර් 4.27 ක අගයක් දක්වා ළඟා විය. පෙර වර්ෂයේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන විට 2009 දෙසැම්බර් මාසය තුළ දී රබර් කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල වාර්තාගත ඉහළම අගය වූ එ.ජ.ඩොලර් 2.53 ක් දක්වා ළඟා විය. වසර ආරම්භයේ සිටම සුළු කෘෂිකාර්මික බෝගවලින් ලද අපනයන ආදායම එ.ජ.ඩොලර් දශ ලක්ෂ 240 ක් වූ අතර ගම්මිරිස්, තල ඇට, තෙල් ලබාගන්නා වෙනත් ඇට වර්ග සහ කොකෝවා වැනි සුළු කෘෂිකාර්මික භෝගයන් රටේ වැදගත් අපනයන ප්‍රභවයන් බවට පත් වෙමින් පවතී. 2009 දෙසැම්බර් මාසයේ දී මැණික් අපනයනයන් ද සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2009 දෙසැම්බර් මාසය තුළදී කාර්මික භාණ්ඩ අපනයන පහත වැටීමට මූලික වශයෙන්ම හේතු වූයේ ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් ආශ්‍රිත නිෂ්පාදන, යන්ත්‍රසූත්‍ර හා උපකරණ අපනයන පහත වැටීමයි. පෙර වර්ෂය සමඟ සසඳන විට මත්ස්‍ය අපනයන සහ කවචයන් සහ මෘද්වංගීන් අපනයන සියයට 25.4 කින් වර්ධනය වුවද ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදන අපනයන පහත වැටුණි.

2009 දෙසැම්බර් මාසයේ දී බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල එ.ජ.ඩොලර් 78 ක් කරා ළඟාවීම නිසා ඛනිජ තෙල් ආනයන වියදම ඉහළ යාම හේතු කොට ගෙන 2009 දෙසැම්බර් මාසයේ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම වර්ධනය විය. කෙසේ වුවත්, පෙර වසරේ දෙසැම්බර් මාසයේ සිට පොහොර ආනයනික මිල සැළකිය යුතු ලෙසින් පහත වැටීම හේතුවෙන් ආනයනය කරන ලද පොහොර පරිමාව ඉහළ ගියද පොහොර ආනයන වියදම පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ අතුරින් සහල් සහ තිරිඟු ආනයනයන් සීඝ්‍ර වර්ධනයක් පෙන්වූ අතර, පැවැති ඉහළ මිල ගණන් මධ්‍යයේ සීනි ආනයනය පහත වැටුණි. මෝටර් රථ සහ යාන්ත්‍රික උපකරණ ආනයන අඩුවීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටුණි. 2009 දෙසැම්බර් මාසයේ දී සියලු කාණ්ඩවලට අයත් ආයෝජන භාණ්ඩ ආනයන පහත වැටුණි.

සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ගලා ඒම වැඩිවීම හේතුවෙන්, වෙළෙඳ ගිණුමේ හිඟය සම්පූර්ණයෙන්ම සමනය විය. 2009 වසර තුළදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 3,330.3 දක්වා සියයට 14.1 කින් වර්ධනය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, වෙළෙඳ හිඟයට වඩා එ.ජ.ඩොලර් දශ ලක්ෂ 532 ක (සියයට 19 ක් පමණ) අතිරික්තයක් පෙන්නුම් කර ඇත.

මෙම කාලපරිච්ඡේදය සඳහා විදේශ වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පෙන්වා ඇත.

**විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය - 2009 දෙසැම්බර් සහ 2009 ජනවාරි - දෙසැම්බර්**

| | 2008 දෙසැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 දෙසැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | දෙසැ. වර්ධනය (සියයට) | 2008 ජන: සිට දෙසැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | 2009 ජන: සිට දෙසැ. එ.ජ.ඩො. දශ ලක්ෂ | ජන: සිට දෙසැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **680.0** | **723.4** | **6.4** | **8,110.6** | **7,084.5** | **-12.7** |
| කෘෂිකාර්මික | 120.8 | 169.3 | 40.2 | 1,854.8 | 1,690.3 | -8.9 |
| මෙයින් තේ | 81.2 | 116.8 | 43.8 | 1,271.5 | 1,185.1 | -6.8 |
| කාර්මික | 556.1 | 548.2 | -1.4 | 6,158.0 | 5,305.4 | -13.8 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 373.3 | 343.5 | -8.0 | 3,468.7 | 3,274.2 | -5.6 |
| ඛනිජ ද්‍රව්‍ය | 3.1 | 5.9 | 90.8 | 97.8 | 88.7 | -9.3 |
| ආනයන | **1,048.6** | **1,053.5** | **0.5** | **14,008.0** | **9,883.2** | **-29.5** |
| පාරිභෝගික භාණ්ඩ | 192.1 | 199.1 | 3.6 | 2,549.2 | 1,939.1 | -23.9 |
| මෙයින් ආහාර හා පාන වර්ග | 101.8 | 130.4 | 28.1 | 1,505.0 | 1,240.7 | -17.6 |
| මෙයින් අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 90.3 | 68.7 | -23.9 | 1,044.2 | 698.4 | -33.1 |
| අන්තර් භාණ්ඩ | 546.5 | 657.2 | 20.3 | 8,340.6 | 5,651.0 | -32.3 |
| මෙයින් ඛනිජ තෙල් | 195.2 | 318.7 | 63.3 | 3,368.2 | 2,166.6 | -35.7 |
| මෙයින් රෙදිපිළි හා ඇඟළුම් | 144.4 | 133.4 | -7.6 | 1,701.9 | 1,441.5 | -15.3 |
| ආයෝජන භාණ්ඩ | 293.6 | 187.5 | -36.1 | 2,978.8 | 2,178.5 | -26.9 |
| මෙයින් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 113.6 | 86.6 | -23.8 | 1,307.7 | 914.5 | -30.1 |
| මෙයින් ප්‍රවාහන උපකරණ | 86.3 | 14.1 | -83.7 | 406.7 | 329.8 | -18.9 |
| මෙයින් ගොඩනැගිලි ද්‍රව්‍ය | 66.6 | 60.1 | -9.8 | 931.6 | 653.3 | -29.9 |
| වෙළෙඳ ශේෂය | **-368.6** | **-330.2** | **-10.4** | **-5,897.4** | **-2,798.6** | **-52.5** |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

2009 දෙසැම්බර් මාසය අවසන් වන විට ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) අරමුදල් සහිතව සහ රහිතව දළ නිල සංචිත ප්‍රමාණය පිළිවෙලින් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 5,357 ක් සහ 5,097 ක් ලෙස වාර්තා විය. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 277 ක් වූ භාණ්ඩාගාර බිල්පත් මත වූ කෙටි කාලීන ශුද්ධ ලැබීම් ද එ.ජ.ඩොලර් දශ ලක්ෂ 1,068 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර මත වූ කෙටිකාලීන ශුද්ධ ලැබීම් ද මීට ඇතුළත් වේ. පසුගිය මාස දොළහ තුළ වූ සාමාන්‍ය ආනයනයන්ට අනුව (මසකට එ.ජ.ඩොලර් දශ ලක්ෂ 823 ක) ආසියානු නිෂ්කාශන සංගමයේ අරමුදල් රහිත දළ නිල සංචිත ප්‍රමාණය මාස 6.2 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් වේ.

## 4. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2008, 2009 සහ 2010

(2002= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 | 2008 | 2009 | 2010 |
| ජනවාරි | 183.5 | 203.1 | 216.4 | 3.0 | -0.3 | 1.4 | 20.8 | 10.7 | 6.5 | 16.4 | 21.6 | 3.1 |
| පෙබරවාරි | 188.6 | 202.9 | 216.9 | 2.8 | -0.1 | 0.2 | 21.6 | 7.6 | 6.9 | 17.0 | 20.3 | 3.1 |
| මාර්තු | 191.9 | 202.0 | | 1.7 | -0.4 | | 23.8 | 5.3 | | 17.7 | 18.6 | |
| අප්‍රේල් | 195.4 | 201.0 | | 1.8 | -0.5 | | 25.0 | 2.9 | | 18.7 | 16.7 | |
| මැයි | 198.5 | 205.1 | | 1.6 | 2.0 | | 26.2 | 3.3 | | 19.8 | 14.7 | |
| ජූනි | 205.9 | 207.8 | | 3.7 | 1.3 | | 28.2 | 0.9 | | 21.0 | 12.5 | |
| ජූලි | 206.4 | 208.7 | | 0.2 | 0.4 | | 26.6 | 1.1 | | 21.9 | 10.4 | |
| අගෝස්තු | 206.3 | 208.1 | | 0.0 | -0.3 | | 24.9 | 0.9 | | 22.6 | 8.5 | |
| සැප්තැම්බර් | 207.2 | 208.6 | | 0.4 | 0.2 | | 24.3 | 1.1 | | 23.2 | 6.6 | |
| ඔක්තෝබර් | 206.6 | 209.4 | | -0.3 | 0.4 | | 20.2 | 1.4 | | 23.4 | 5.2 | |
| නොවැම්බර් | 205.2 | 211.0 | | -0.7 | 0.8 | | 16.3 | 2.8 | | 23.0 | 4.1 | |
| දෙසැම්බර් | 203.7 | 213.5 | | -0.7 | 1.2 | | 14.4 | 4.8 | | 22.6 | 3.4 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව